දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය -I කොටස - 2019
--------------------------------------------------------------

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - I කොටසේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, ජාත්‍යාන්තර ආයෝජන කේන්ද්‍රයක් ලෙස හම්බන්තොට සංවර්ධනය කිරීම සඳහා සහාය හා කාර්යයන් පහසුකරලීම සඳහා මාර්ග ජාලය සංවර්ධනය කිරීමයි. ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත සමස්ථ පිරිවැය රු.මිලියන 103,280 කට සමාන එ.ජ.ඩො. මිලියන 804.11 වූ අතර එයින් රු.මිලියන 87,788 කට සමාන එ.ජ.ඩො. මිලියන 683.49 ක් සැපයීමට චීන අපනයන ආනයන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 15,492 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජනවාරි 19 දින ආරම්භ කරන ලද අතර 2019 ජූලි 18 වන විට නිම කිරීමට නියමිතය.

1.3 මතය
------

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම
--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරනනේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක **08** ට පටහැනිව, **2019** දෙසැම්බර් **31** දිනට ඉඩම් අත්පත් කර ගැනීම් මත ප්‍රමාද පොළිය ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | පිළිගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක **08** අනුව අදාළ ප්‍රතිපාදන සැලසිය යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ ගෙවීම් ප්‍රමාද වීම මත පොළිය ලෙස රු. මිලියන **71.84** ක් සහ එ.ජ.ඩො. මිලියන **3.9** ක මුදලක් ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන **608.66** ක ගණනය කළ ප්‍රමාද පොලී හඳුනාගෙන හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | පිළිගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක **08** අනුව අදාළ අසම්භාව්‍ය වගකීම් හඳුනාගෙන ඒවා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| දෝෂ දැනුම්දිය හැකි කාලය සහ ණය පහසුකම සක්‍රියව පවතින කාලය පිළිවෙලින් **2020** නොවැම්බර් **08** සහ **2020** ඔක්තෝබර් **25** දිනෙන් අවසන් වුවද, ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ අන්තර් හුවමාරුවක් පිහිටුවීමේ ස්ථානයක් ලෙස හඳුනා නොගත් කපුදූව ප්‍රදේශයේ අර්ධ අන්තර් හුවමාරුවක් ඉදිකිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන **459.8** ක් වූ ඉදිකිරීම් යෝජනාව විගණිත දිනය වූ **2021** පෙබරවාරි **03** දක්වා ඉංජිනේරුවරයා විසින් අනුමත කර නොතිබුණු අතර මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් **2020** නොවැම්බර් **10** වන දින පැවති රැස්වීමේ දී ගනු ලැබූ තීරණය මත ඉදිකිරීම් ආරම්භ කර තිබුණි. | මුල් කොන්ත්‍රාත්තුවේ පිරිවැය වැඩ අවසන් කළ පිරිවැයට වඩා අඩු විය හැකි අතර සැලසුම් කිරීමේ ප්‍රමාදය කොන්ත්‍රාත් පිරිවැය ඉහලයෑමට හේතුවනු ඇත. | කපුදූව අර්ධ අන්තර් හුවමාරුවේ ඉදිකිරීම් කටයුතු **2021** අප්‍රේල් මස මුල් සතියේදී නිම කරන ලදී. වැඩ අවසන් කිරීමේ සහතිකය නිකුත් කිරීමේදී මෙම කාර්යය අවසන් කර නොමැති කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණි. | ඉදිරි සැලසුම් වලදී සියලු අංශ සලකා බලා හොඳම ප්‍රතිඵලය අවම පිරිවැයකින් මහජනයාට ලබාදීමට කටයුතු කළ යුතුය. |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සේවා ප්‍රදේශයක් ඉදිකිරීම සඳහා ප්‍රමාණ පත්‍රවල ප්‍රතිපාදන සලසා නොතිබුණද, ඉඩම් දෙකක් අත්පත් කරගෙන තිබුණි. තවද, දක්ෂිණ අධිවේගී මාර්ගයේ කි.මී. 46 සීමාවෙන් පසු අධිවේගී මාර්ග භාවිතා කරන්නන් සඳහා සේවා ප්‍රදේශයක් නොතිබුණි. එබැවින් වැලිපැන්න සිට හම්බන්තොට දක්වා කි.මී. 173 ක් ගමන් කිරීමේදී මහජනතාවට සේවා සැපයීම ප්‍රශ්නගත වනු ඇත. | වැලිපැන්න සිට හම්බන්තොට දක්වා කි.මී. 176 ක දුරක් ගමන් කරන මගීන්ට සේවා සැපයීම ගැටලු සහගත තත්ත්වයකට පත් වීම. | අවශ්‍ය යෙදවුම් ද.අ.මා.ව්‍යා. 1 හි කොන්ත්‍රාත් ප්‍රමාණ පත්‍රවල ඇතුළත් කර නොතිබුණි. එබැවින්, සේවා ප්‍රදේශය ඉදිකිරීම වෙනම අරමුදල් සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය විය. | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය සඳහා සේවා ප්‍රදේශ ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැළසිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසානයේ සේවා ප්‍රදේශයේ අතිරික්ත පස් ඝ.මී. 248,419 ක ප්‍රමාණයක් ගොඩගසා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම අතිරික්ත පස් ව්‍යාපෘතිය හෝ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රයෝජනයට ගැනීමේ සැලසුමක් නොතිබුණි. | පස් අනිසි ලෙස භාවිතා කිරීමේ හැකියාව. | මෙම අතිරික්ත පස් ප්‍රමාණය ගැටමාන්න ප්‍රදේශයේ මාර්ගයට අයත් ප්‍රදේශය (ROW) තුළ ගොඩගසා ඇත. ඒ අවට ප්‍රදේශවල ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම පස් ප්‍රයෝජනයට ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. | නිශ්චිත ව්‍යාපෘතියක් සඳහා මෙම පස් යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණය අනුව, සවිස්තරාත්මක සැලසුම් අදියරේදී යෝග්‍ය මාර්ග මතුපිට වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයක් තීරණය කර නොතිබීම හේතුවෙන් ස්පුන් පම්බාර (Spun Piles) සඳහා රු. 16,873 ක ඒකක ගාස්තුවක් සහ ඒ මත අතුරු ගෙවීම් සහතික මගින් සිදු කරන ලද හිඟහිටි ගෙවීම් සඳහා පොලී මුදලක් කොන්ත්‍රාත්කරුට හිමිව තිබුණි. ඒ අනුව රු. මිලියන 71.26 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබූ අතර ඉන් ප්‍රමාද පොලිය ලෙස ගෙවා තිබුණු රු. මිලියන 1.87 ක මුදල ව්‍යාපෘතියට අමතර වියදමක් වනු ඇත. | ව්‍යාපෘතිය සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවීමේ ඇති හැකියාව. | කො.පො.කො. 20.2 උප වගන්තියට අනුව, ව්‍යාපෘතියේ ආරවුල් විනිශ්චය මණ්ඩලය පිහිටුවන ලදී. ඒ අනුව, ආ.වි.ම. විසින් සහ සුහද බේරුම්කරණ කමිටුව (Amicable Settlement Committee) විසින් ලබා දී ඇති තීරණයේ නියම කර ඇති පරිදි කොන්ත්‍රාත්කරු වෙත අදාළ ගෙවීම් සිදු කර ඇත. | අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා නියමිත වේලාවට නිවැරදි තීරණය ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | කොන්ත්‍රාත් ලියකියවිලිවල සහ කොන්ත්‍රාත්කරුට ලබාදුන් ඉංජිනේරුවරයාගේ උපදෙස්වල ඇති අපැහැදිලි නිර්වචන නිසා ජම්බාර වැඩ සඳහා වූ කොන්ක්‍රීට් පන්තියට සහ ජම්බාර හැර අනෙකුත් ව්‍යුහාත්මක කටයුතුවලට අදාළව ලබා දී ඇති පිරිවිතරයන් කොන්ත්‍රාත් විචලනයන් වන අතර ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට රු. මිලියන 129.11 ක අතිරේක ගෙවීමක් සිදුකර ඇති අතර එය ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණය මත ප්‍රමාදය හෝ ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම මත වූ පිරිවැය සහ පොලී ඉහලයාමක් වනු ඇත. | ව්‍යාපෘතිය සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවීමේ ඇති හැකියාව. | කො.පො.කො. 20.2 උප වගන්තියට අනුව, ව්‍යාපෘතියේ ආරවුල් විනිශ්චය මණ්ඩලය පිහිටුවන ලදී. ඒ අනුව, ආ.වි.ම. විසින් සහ සුහද බේරුම්කරණ කමිටුව (Amicable Settlement Committee) විසින් ලබා දී ඇති තීරණයේ නියම කර ඇති පරිදි කොන්ත්‍රාත්කරු වෙත අදාළ ගෙවීම් සිදු කර ඇත. | කොන්ත්‍රාත් ලේඛනවල කොන්දේසි පැහැදිලිව අර්ථ දැක්විය යුතුය. |
| (ඉ) | පහසුකම් සැපයීමේ ගොඩනැගිලි රු. මිලියන 185 ක වියදමකින් ස්ථිර පදනමින් ඉදිකර තිබුණද, ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලිවල අපේක්ෂිත භාවිතය පිළිබඳ මූලික සැලැස්මක් තීරණය කර නොතිබුණි. තවද, විගණනිත දිනය වූ 2021 පෙබරවාරි 05 දින වන විටත් ගොඩනැගිලිවල අපේක්ෂිත භාවිතය සඳහා නිසි සැලැස්මක් සකස් කර නොතිබුණි. | අනාගතයේදී ගොඩනැගිලි අනිසි ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව. | අතිරේක අධ්‍යක්ෂ (ඉදිකිරීම්) කාර්යාලය පිහිටුවීම සඳහා ගොඩනැගිලි දෙකක් වෙන් කරන ලදී. අනෙකුත් සියලුම ගොඩනැගිලි ඔවුන්ගේ කාර්යාල පිහිටුවීම සඳහා මා.ස.අ. හි අධිවේගී මාර්ග කළමනාකරණ ඒකකයට සහ පොලිසියේ සහ විශේෂ කාර්ය බළකායයේ නවාතැන් සැපයීමට භාර දිය යුතුය. | ව්‍යාපෘති කටයුතු සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදි කිරීමේදී, ව්‍යාපෘතිය අවසානයේ එම ගොඩනැගිලිවල අපේක්ෂිත භාවිතය පිළිබඳ මූලික සැලැස්මක් තිබිය යුතුය. |
| (ඊ) | අදාළ කොන්ත්‍රාත්කරුගේ පිරිවැයෙන් කාර්ය සාධන ඇපකරය ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසියේ 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති ප්‍රතිපාදනවලට පටහැනිව, කාර්ය සාධන ඇපකරය සැපයීමේ පිරිවැය සඳහන් කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට ඉඩ සලසමින් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රයේ වෙනම ගෙවීම් අයිතමයක් සකස් කර තිබුණි. ඒ අනුව, කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රමාණ පත්‍රවල වටිනාකම රු.97.8 කින් ඉක්මවා 2020 ජූලි 31 දින දක්වා රු. මිලියන 322.8 ක මුදලක් අතිරේකව ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය වාසියක් අත්වීම. | මෙම අයිතමය වෙන්කල මුදලක් (Provisional Sum) ලෙස ඇතුළත් කර ඇත. එබැවින්, සේවායෝජකයාගේ අභිප්‍රාය වූයේ කාර්ය සාධන ඇපකරය සැපයීම වෙනුවෙන් ගෙවීමක් කිරීම වනු ඇත. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කළ යුතුය. |